## 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත

## 11 වන වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 11 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්, ජයකොඩි ආරච්චිගේ සුමිත් වන මා විසින්, මහජනයාගේ හිත පිණිස සහ පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුවේ උපදේශය මත, මේ නියමය මගින්, 2018 ඔක්තෝබර් මස 02 වැනි දිනැති අංක 2091/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද නියමයෙහි II වන උපලේඛණය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

ආචාර්ය ජේ.ඒ.සුමිත්,<br>
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

2019 නොවැම්බර් මස 25 වැනි දින,<br>
පේරාදෙණියේ දී ය.

### II වන උපලේඛණය

"මෙහි 1 වන උපලේඛණයේ නිශ්චිතව දක්වා ඇති රසායන සංක්ෂිප්ත සේවාවේ ලියාපදිංචි අංකය දරන සක්‍රීය රස ද්‍රව්‍යය අන්තර්ගත වන සෑම පළිබෝධනාශකයකම මෙහි පහත වගුවේ නිශ්චිතව දක්වා ඇති සහකාරක ද්‍රව්‍යය රහිත විය යුතු අතර එකී පළිබෝධනාශකය තේ සහ රබර් වගාවන් හි වල් මර්දනය සඳහා සහ පොල් වගාවේ වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය, උක් වගාවේ සුදු පත්‍ර රෝගය සහ විසිතුරු පත්‍රික ශාක දඬු වල ප්‍රරෝහණ හැකියාව නිෂ්ක්‍රීය කිරීම සඳහා පමණක් භාවිතා කරනු ලැබිය යුතුය".

| රසායන සංක්ෂිප්ත සේවාවේ ලියාපදිංචි අංකය | සහකාරක ද්‍රව්‍යය |
|---|---|
| 61791-26-2 | පොලිඔක්සිඑතිලීන් ඒමයින් |